**කින්නියා නගර සභාව  -  2022**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කින්නියා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සහ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග කළ එකතුව රු.481,999ක් වූ භාණ්ඩ වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ ලේඛනයේ ඇතුළත් කර ඇති බව. | ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභා අරමුදලින් සිදුකළ රු. 21,488,717ක් වටිනා ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | පුනරාවර්තන හා මූලධන වියදම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ණය පදනම මත ලබාගත් රු. 685,745ක ටයර් වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | මෙම මූල්‍ය වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල වියදම් නියමිත වර්ෂයට ඇතුළත් කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ අවසන් දිනට පැවති සේවක ණය ශේෂය ඉදිරියට ගෙන ඒමේදී රු.22,500ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. ඉදිරි කාලයේදි ක්‍රියාමාර්ග ගෙන නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළයුතුය. |
| (ඉ) | ආදායම් හා වියදම් ගිණුමෙන් සමුච්චිත අරමුදල් ගිණුමට මාරුකළ අතිරික්තය රු.3,214,033ක් වුවද සමුච්චිත අරමුදල් ගිණුමේ එය රු.15,760,340ක් ලෙස දැක්වීමෙන් සමුච්චිත අරමුදල් ගිණුමේ අතිරික්තය රු.12,546,307ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | පළාත් පාලන ආයතන සඳහා විශේෂ සංවර්ධන වැඩසටහන (LDSP) යටතේ සමාලෝචිත වර්ෂයේ ඉදිකළ රු.2,114,483ක නේවාසිකාගාරයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි අප වෙත භාරදීමෙන් පසුව අවසන් ගිණුම්වල ඇතුළත් කරන බව. | -එම- |
| (උ) | සභා අරමුදලින් සමාලෝචිත වර්ෂයේ ලබාගත් රු.1,123,500ක් වටිනා ළමා උද්‍යාන භාණ්ඩ වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඔබ විසින් සිදුකළ අනාවරණය කිරිමට අනුකූලව ගිණුම් වාර්තාවේ අළුත් අයිතමයන් එකතු කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රතිසංස්කරණ කාර්යයන් වෙනුවෙන් ගෙවිය යුතු රු. 6,923,868ක් ගිණුම් ගතකර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි කාලයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරන බව. | -එම- |
| (එ) | පසුගිය වර්ෂයේ ලැබී තිබූ මුද්දර ගාස්තු රු. 1,806,583ක් එම වර්ෂයේ නිවැරදිව ගිණුම්ගත කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේත් එම වටිනාකම සමුච්චිත අරමුදලට බැර කර ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමේත් හර කර තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවේ මෙවැනි දෝෂ සිදුනොවන අයුරින් නිවැරදි කර ඔබ වෙත ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඒ) | ඉකුත් වර්ෂ 03 වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු රු.703,893ක් සඳහා සහ සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවේ ආරම්භක ශේෂ සමාන වීම සඳහා ජ'නල් සටහන් මගින් නිවැරදි කිරිම් කරන බව. | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන සේවකයින් සඳහා ගෙවූ විශ්‍රාම වැටුප් දායකත්වය රු.187,464ක් අඩුවෙන් දක්වා තිබුණි. | එම හිඟහිටි එකතු කර නොතිබුණි. ඉදිරි කාලයේදී නිවැරදි කරන බව. | -එම- |

1.6.3 **නොසැසඳූ පාලන ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් 08ක ශේෂ සහ උපලේඛන වල එකතුව අතර රු.3,933,820ක වෙනසක් විය. | මෙම මූල්‍ය වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිසි පරිදි සැසඳීම් කළ යුතුය. |

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.198,076,085 ක් වටිනා ගිණුම් ශේෂ 09 ක් ස්ථාවර වත්කම් ලේඛන, වරිපනම් ලේඛන, බදු කුලී ලේඛන, ණයහිමි ලේඛන, සහ මුද්දර ගාස්තු හා උසාවි දඩ ලේඛන, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරියේදී ලේඛන නිවැරදි කරන බව. | ලේඛන යාවත්කාලීන කර පවත්වාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | සභාවේ භාවිතයේ පවතින වාහන 33ක දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශවල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම වර්ෂයේ නිසි අයුරින් විගණනයට ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛය | අසමාලෝචිත වර්ෂයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකර අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් එකතුව රු.1,054,876ක් ගෙවා තිබුණි. | මෙම මූල්‍ය වර්ෂයේ නව යන්ත්‍ර සවිකර ඇඟිලි සලකුණු සටහන් කරන බව. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | නගර සභාවේ භාවිතයේ පවතින වාහන 33ක ඉන්ධන පරිභෝජනය පිළිබඳව පරීක්ෂාව සිදුකර නොතිබුණි | පසුව ඉන්ධන පරීක්ෂාවක් සිදු කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම් රු.11,674,683ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 5,021,055ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම රු. "000" | බිල්කළ ආදායම රු. "000" | රැස්කළ ආදායම රු. "000" | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. "000" | ඇස්තමේන්තුගත ආදායම රු. "000" | බිල්කළ ආදායම රු. "000" | රැස්කළ ආදායම රු. "000" | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු."000" |
| වරිපනම් හා බදු | 4,911 | 4,911 | 2,510 | 7,695 | 4,911 | 4,911 | 1,544 | 5,294 |
| කුලී | 20,345 | 12,659 | 3,063 | 45,911 | 19,196 | 19,196 | 3,003 | 36,315 |
| බලපත්‍ර ගාස්තු | 1,675 | 1,675 | 1,675 | -- | 1,363 | 1,363 | 1,363 | -- |
| වෙනත් ආදායම් | 4,200 | 4,200 | 1,029 | 9,647 | 7,095 | 7,095 | 618 | 6,476 |
| | 31,131 | 23,445 | 8,277 | 63,253 | 32,565 | 32,565 | 6,528 | 48,085 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ අයකළ යුතු රු. 10,205,311කින් වර්ෂය අවසාන වන විටත් රු.7,694,359ක් හිඟහිටිව පැවතුණි. | නගර සභාවේ සේවයේ නියුතු අනියම් සේවකයන්ව ඍජු ක්ෂේත්‍ර චාරිකාවන් මගින් පසුගිය කාලයේ හිඟහිටි සහ මෙම වර්ෂයට අදාල හිඟහිටිද සමග වර්තමානයේ අයකරන බව. | පනතේ විධිවිධාන අනුව ආදායම් රැස් කළ යුතුය. |
| (ii) | කින්නියා ප්‍රධාන මාර්ගයේ කඩකාමර 65ක් තිබූ නමුත් මේ සියළු කඩකාමර සඳහා වර්ෂ 10කට වඩා පැරණි දේපළ තක්සේරුවක් මත ආදායම් ගණනය කිරීම හා කාලානුරූපීව තක්සේරු සිදුනොකිරීම නිසා විශාල ප්‍රමාණයක ආදායම් අහිමි වී තිබුණි. | මේ දක්වා තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තා අප වෙත නොලැබීම හේතුවෙන් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට නොහැකිවී ඇති බව. | තක්සේරු කඩිනමින් සිදු කරවා ගතයුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | නගර සභාව විසින් පොදු වෙළෙඳ පොල සහ ගව මස් වෙළදාම් කිරීමේ අයිතිය බදුදීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කුලීය රු.45,910,123ක් විය. | COVID19, ආර්ථික අර්බුදය සහ ඉන්ධන අර්බුදය හේතුවෙන් ආදායම් අයකිරීමේ ගැටළු පවතී. එසේ වුවත්, පොදු වෙළෙඳ පොල සඳහා 2022 වර්ෂයේ කිසිදු හිඟහිටි නොමැතිව අයකිරීම් සිදුකර තිබුණ බව. | ගිවිසුම් අනුව ශීඝ ආදායම් අයකර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාළු වෙළෙඳපොල හිඟහිටි කුලීය රු.7,595,000ක් විය. | අධිකරණයේ නඩුවක් පැවැරීමට තීරණය කර ඇති බව. | -එම- |

(ඇ) **මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.5,897,150ක් විය. | නියමිත කාලසීමාවන්හිදී උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | නියමිත කාලය තුළ ගාස්තු අයකර ගැනීමට පියවර ගතයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වාහන 08ක බලපත්‍ර නියමිත කාලය තුළ අලුත් නොකිරීම හේතුවෙන් හිඟ මුදල් සහ දඩ වශයෙන් රු. 23,960ක් සහා අරමුදල්වලින් ගෙවා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ ඇතැම් වාහන දෝෂ සහිත බව හඳුනා ගෙන ඒවා අලුත්වැඩියා කිරීමෙන් පසු වාහන බලපත්‍රය ලබා ගන්නා ලදී. මේ වනවිට නියමිත කාලය තුළ බලපත්‍ර ලබා ගන්නා බව. | නියමිත කාලය තුළ වාහන බලපත්‍ර ලබාගත යුතුය. |

### 3.2 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | නියමිත දිනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් නොගෙවීම හේතුවෙන් 2021 ජූලි සිට 2022 ජනවාරි දක්වා කාලපරිච්ඡේදය සඳහා රු.11,624ක දඩ ගාස්තු ගෙවා තිබුණි. | වර්තමානයේ නියමිත මාසයට වැටුප් ගෙවීම් සඳහා ආදායම් එකතු කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | අදාළ පනතට අනුකූලව නියමිත කාලයේ ගෙවීම් සිදුකර දඩ මුදල් ගෙවීම වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) හිමිකාරිත්වය මාරු නොකළ වත්කම්** | | |
| සභාව භාවිතා කරන වාහන 13ක අයිතිය පවරාගෙන නොතිබුණි. | වාහනවල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කරන බව. | වාහන හිමිකාරිත්වය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. |
| **(ආ) නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්** | | |
| සභාවේ කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයට පළාත් සංවර්ධන විශේෂ ව්‍යාපෘති (LDSP) මගින් සමාලෝචිත වර්ෂයේ රු.850,000කට මිලදී ගත් compost crusher යන්ත්‍රය වර්ෂයකට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරි කාලයේදි ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නා බව. | නියමිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතුය. |